# කාර්ය සාධන වාර්තාව

## ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා


ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

අංක 35 ඒ,

ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත

බොරැල්ල

කොළඹ 08



## කොමසාරිස්තුමියගේ පණිවිඩය

වර්තමානය වන විට බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් වසර 02කට වඩා අඩු බන්ධනාගාරගත කිරීම් හෝ නියමිත දඩ මුදල ගෙවා ගත නොහැකිව බන්ධනාගාරගත වූවන් වේ. නමුත් විකල්ප දණ්ඩන ක්‍රමවේදයක් ලෙස සුළු අපරාධකරුවන් ප්‍රජා පාදක විශෝධනයට යොමු කිරීම මගින් පෞද්ගලිකව එම වරදකරුටද ඔහුගේ/ඇයගේ පවුලට හා සමාජයට මෙන්ම රජයටද අත්වෙන වාසි රැසකි.

ගතවූ 2018 වසර තුළ ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය වෙත යොමු කරන ලද වරදකරුවන් වැඩි ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා වැරදිකරුවන් වූවන්ය. මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් විශෝධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ වයඹ,දකුණ හා සබරගමුව පළාත්වල මෙන්ම අනෙක් පළාත්වලද එම වරදකරුවන් විශෝධනයට ලක් කිරීමට අපගේ නිලධාරීන් සමත්ව ඇත.

සියල්ල වෙනස් වන ලෝකය තුළ වුවද වෙනස් කිරීමට අපහසුම දේ මිනිස් චර්යාවයි. කුමන හෝ හේතුවක් මත වරදකට යොමු වූ වැරදිකරුවන්ගේ වරදකාරී චර්යාවට හේතු සොයා ඊට පිළියම් කිරීම මගින් නැවත නැවත වරදට යොමු වීම වළක්වා ඔවුන් සමාජයට වැඩදායී යහපත් පුද්ගලයන් ලෙස සමාජගත කිරීමේ වගකීම අපි ඉටු කරන්නෙමු.



ආර්.පී.එස්. සමන්කුමාරි

කොමසාරිස්

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

පටුන


**01. හැඳින්වීම**

01.1 අරමුණු 01-04

01.2 සංවිධාන ව්‍යුහය 05-06

**02. විශෝධන ක්‍රියාවලිය**

2.1 ප්‍රජා පාදක විශෝධන ආඥා 07-16

2.2 පවත්වන ලද විවිධ විශෝධන වැඩසටහන් (2018.01.01- 2018.12.31) 17-18

2.2.1 උපදේශන හා මත් නිවාරණ වැඩසටහන් 19-20

2.2.2 සංවර්ධන හා ශ්‍රමදාන වැඩසටහන් 20-21

2.2.3 ආගමික හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 21-22

2.2.4 ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් 22-23

2.3 මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරිමේ ව්‍යාපෘතිය- වයඹ,දකුණු සහ සබරගමුව පළාත්

2.3.1 පසුබිම 24

2.3.2 වර්ෂ 2018 දී මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ලබා දී ඇති ප්‍රජා පාදක විශෝධන නියෝග පිළිබඳ තොරතුරු 25

2.3.3 ව්‍යාපෘතියේ අරමුණු 25-26

2.3.4 ව්‍යාපෘතියේ උපායමාර්ග 26

2.3.5 ව්‍යාපෘතියේ ප්‍රතිඵල 26-27

2.3.6 ව්‍යාපෘතියේ ප්‍රගතිය 28

2.3.7 ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් 28-29

**03. ධාරිතා සංවර්ධනය**

3.1 නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු කිරීමේ වැඩසටහන් 29

3.2 2018 වර්ෂයේදී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් සඳහා මුදල් ගෙවීම් කර ඇති ආකාරය 29

**04. ඉදිරි සැලසුම්** 30

**05. මූල්‍ය කාර්ය සාධනය** 31-32

## 01. හැඳින්වීම


ශ්‍රී ලංකාවේ ප්‍රජා පාදක විශෝධන ක්‍රමය 1999 වසරේ දී අධිකරණ අමාත්‍යාංශයට අයත් නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද අතර අත්හදා බැලීමක් ලෙස 2000.02.17දින මහේස්ත්‍රාත් අධිකරණ 03කින් එනම් අළුත්කඩේ,මාලිගාකන්ද,කොටුව අධිකරණ ආශ්‍රිතව ප්‍රජා පාදක විශෝධන ක්‍රමය ආරම්භ කරන ලදි. 2003 වසරේදී මෙය අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ඒකකයක් බවට පත් වූ අතර එහි සාර්ථකත්වය මත 2008.07.01 අධිකරණ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදි. මේ වන විට දිවයින පුරා මහේස්ත්‍රාත් අධිකරණ හා සංචාරක අධිකරණ 125ක ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනතට අනුව බන්ධනාගාර ගත කිරීමේ අවම දඬුවමක් නියම කිරීම අනිවාර්ය නොවන වරදක් හෝ වරද සඳහා නියමිත දණ්ඩනය අවුරුදු 02 කට වඩා අඩු බන්ධනාගාර ගත කිරීමේ වරදක් සඳහා අධිකරණය විසින් වරදකරු කරනු ලබන අවස්ථාවක අධිකරණය විසින් එවැනි වරදකරුවෙකු වෙත බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් හෝ අත්හිටුවන ලද බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් හෝ දඩයක් නියම කිරීම වෙනුවට ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ලබාදිය හැකිය. ඒ අනුව ප්‍රජා පාදක විශෝධන ආඥාවක් සඳහා පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් ඇතුළත් කරනු ලැබිය හැකිය. එනම්

- ප්‍රජා වැඩ , අධිකරණය විසින් නිශ්චය කරනු ලබන කාලයක් වරදකරු විසින් ඉටුකරනු ලබන බව
- අධීක්ෂණය,ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිටින බව
- අධ්‍යාපනික , වෘත්තීයමය,පෞද්ගලික පුහුණුවීම් හා සංවර්ධන වැඩසටහන් වලට වරදකරු සහභාගි වන බව
- වරදකරුට ඔහුගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තක්සේරුවකට භාජනය විය යුතු බව හා ඒ සඳහා ප්‍රතිකාර ලබා ගත යුතු බව
- වරදකරුට ඔහුගේ අපරාධකාරී චර්යාවට පිළියම් යෙදීම සඳහා ඇති වැඩසටහන් වලට සහභාගි විය යුතු බව

වරදකරුවෙකු බන්ධනාගාරගත වූ විට එම තත්ත්වය සාමාජීය හා ආර්ථික වශයෙන් බලපාන අතර සුළු වරදකරුවන් බන්ධනාගාරගත වීමෙන් දරුණු අපරාධකරුවන් සමඟ ඇසුර නිසා ඉදිරියේ දී දරුණු අපරාධකරුවන් බවට හා සමාජ විරෝධී අදහස් ඇති පුද්ගලයන් බවට පත් විය හැකිය. එමෙන්ම බන්ධනාගාරගත වීම තුළ රැකියාව අහිමි වීමේ අවදානම හා පවුලේ ආදායම් උපයන්නා බන්ධනාගාරගත වීම තුළ පවුලේ සාමාජිකයින්ට පිළිසරණ අහිමි වීමෙන් ඔවුන් පවුලේ නඩත්තුව සඳහා තවදුරටත් සමාජ විරෝධී ක්‍රියාවල නිරතවීමක් සිදු වේ. පාසැල් යන වයසේ දරුවන්ට පාසැල්

අධ්‍යාපනය අහිමි වීමත්, ඔවුන්ට පවුලේ නඩත්තුව සඳහා දායක වීමටත් සිදු වේ. ඊට අමතරව පුද්ගලයන් බන්ධනාගාරගත වීම තුළ රැඳවියන්ට ආහාර හා ඇඳුම් සැපයීම ඇතුළුව බන්ධනාගාර නඩත්තුව සඳහා රජයට විශාල මුදලක් වැය කිරීමට සිදුවන අතර බන්ධනාගාර තුළ තදබදය වැඩිවීමෙන් පරිපාලන ගැටළු ඇති වේ. මේ අනුව සුළු වරදකරුවන් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා යොමු කිරීම තුළත් බන්ධනාගාර තදබදය අවම කිරීමත් බන්ධනාගාර නඩත්තුව සඳහා යන වියදම අවම කිරීමත් සිදු කළ හැකිය. මේ අනුව සුළු වරදකරුවන් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබාදීම තුලින් එම වරදකරුවන්ගේ අපරාධකාරී චර්යාවන් අවම කළ හැකි අතර ඔවුන් සමාජය තුළ තබා ගනිමින් යහපත් පුරවැසියෙකු බවට පත් කළ හැක.


දැක්ම
සුළු වරදකරුවන් සහ වරදට පෙළඹිය හැකි පුද්ගලයින් යහපත් පුද්ගලයන් බවට පත් කිරීම
මෙහෙවර
පසු විපරමක් සහිත ඵලදායී ප්‍රජා විශෝධන ක්‍රියාවලියක් තුලින් සුළු වරදකරුවන් , වරදට පෙළඹිය හැකි පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල් ආර්ථික,සාමාජීය හා ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කිරීම.
අගයන්
සම්පත් උපරිම භාවිතය
නිර්මාණශීලීභාවය
කණ්ඩායම් හැඟීම
නිරන්තර දියුණුව
වගවීම

## 01.1 අරමුණු

1 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක වීම මගින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ විශෝධනය කිරීම.

2 සුළු වරදකරුවන් බන්ධනාගාරගත වීම අඩුකර බන්ධනාගාර තදබදය හා ඒ සඳහා වැයවෙන රජයේ වියදම් අඩුකිරීම.

3 ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යොමුකර ගැනීම.

4 ප්‍රජා විශෝධන ආඥාලාභීන් මානසික, අධ්‍යාත්මික, සමාජීය හා ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම.

5 ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ පවුල් ආර්ථික සමාජීය හා ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කිරීම.


**කාර්යන්/සැළසුම්**

1. අධිකරණ මඟින් සුළු වැරදිකරුවන් වූ පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා ඇතුළත් කිරීම
2. ආඥාලාභීන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ආගමික සංවර්ධන වැඩසටහන් සංවිධානය.
3. ආඥාලාභීන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය හා උපදේශන වැඩසටහන් ඇති කිරීම
4. ආඥාලාභීන්ගේ විශේෂ හැකියාවන් හා ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. ආඥාලාභීන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටු වීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
6. ආඥාලාභින් මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම
7. පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
8. ප්‍රජා වැඩ සඳහා යොදවනු ලබන ආඥාලාභීන් ප්‍රජාවට ඵලදායී සේවයක යෙදවීම.

**ආයතනයේ ප්‍රමුඛතා**

1. ඵලදායී පුනරුත්ථාපන හා ප්‍රතිකාරාත්මක වැඩපිළිවෙලක් තුළින් ප්‍රජා පාදක විශෝධන ආඥාලාභීන් යහපත් පුරවැසියන් බවට පත් කිරීම
2. මානව සම්පත් සංවර්ධනය

## 01.2 සංවිධාන ව්‍යුහය



**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2018.12.31 දිනට කාර්ය මණ්ඩල විස්තර**

| | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ප්‍රජා විශෝධන කොමසාරිස් | 01 | 01 |
| 2 | සහකාර කොමසාරිස්/නියෝජ්‍ය කොමසාරිස් | 02 | 01 |
| 3 | ගණකාධිකාරි | 01 | 01* |
| 4 | ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි | 12 | 02 |
| 5 | පරිපාලන නිලධාරී | 01 | 01* |
| 6 | භාෂා පරිවර්ථක(දෙමළ) | 01 | - |
| 7 | ප්‍රජා විශෝධන නිලධාරි | 112 | 105 |
| 8 | වැඩසටහන් සහකාර | 04 | 02 |
| 9 | සංවර්ධන නිලධාරී<br>අභ්‍යාසලාභී | 328 | 270<br>04 |
| 10 | තොරතුරු සන්නිවේදන සහකාර | 02 | 01 |
| 11 | රාජ්‍ය කළමණාකරණ සහකාර<br>ලිපිකරු | 20 | 12<br>06 |
| 12 | වැඩ පරීක්ෂක | 114 | 111<br>01 ** |
| 13 | කාර්යාල කාර්ය සහයක | 08 | 05 |
| 14 | රියදුරු | 03 | 02 |
| **එකතුව** | | **609** | **523** |

** ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය ගිය සේවකයෙකු සඳහා රා.ප.ච. අනුව වැටුප් ගෙවනු ලැබේ.

* කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන්සේවයේ යොදවා ඇත.


## 2. විශෝධන ක්‍රියාවලිය

### 2.1 ප්‍රජා පාදක විශෝධන ආඥා

දිවයින පුරා මහේස්ත්‍රාත් අධිකරණ වලින් ප්‍රජා විශෝධන ආඥා මත ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව පළාත් අනුව පහත පරිදි වේ.

2018-01-01 සිට 2018-12-31 දක්වා

| **පළාත** | **වරදකරුවන් සංඛ්‍යාව** |
|---|---|
| බස්නාහිර | 5382 |
| මධ්‍යම | 825 |
| දකුණ | 1972 |
| උතුර | 1318 |
| නැගෙනහිර | 496 |
| වයඹ | 890 |
| උතුරු මැද | 214 |
| ඌව | 495 |
| සබරගමුව | 1191 |
| **එකතුව** | **12783** |





ඉහත ප්‍රස්ථාරයට අනුව වැඩිම අඥාලාභීන් ප්‍රමාණයක් බස්නාහිර පළාතට අයත්ය .අඩුම ආඥාලාභීන් ප්‍රමාණය උතුරු මැද පළාතින් ලැබී ඇත .මධ්‍යම පළාතට අයත් ආඥාලාභීන් ප්‍රමාණය ඌව පළාතට අයත් ආඥාලාභීන් ප්‍රමාණය මෙන් දෙගුණයකට ආසන්න වෙයි. දකුණ, සබරගමුව හා උතුරු පළාත් වලට අයත් ආඥාලාභීන් ප්‍රමාණය ඉහළ අගයක් ගනී .

➢ **ලබාගත් විශෝධන ආඥා - වරද අනුව - (2018.01.01 – 2018.12.31)**


| වරදේ ස්වභාවය | නියෝග ලැබූ සංඛ්‍යාව | ප්‍රතිශතය(%) | |
|---|---|---|---|
| හෙරොයින් | 3131 | 24.49% | 65.21% |
| ගංජා | 1418 | 11.09% | |
| නීති විරෝධී මත්පැන් | 3788 | 29.63% | |
| මහජන පීඩා | 907 | 7.10% | |
| සොරකම් | 42 | 0.33% | |
| වංචාව | 2 | 0.02% | |
| නීතිවිරෝධී අවි | 18 | 0.14% | |
| සොරබඩු ලඟ තබා ගැනීම | 4 | 0.03% | |
| සූදුව | 956 | 7.48% | |
| කෝලාහල | 5 | 0.04% | |
| වෙනත් | 2512 | 19.65% | |
| **එකතුව** | **12783** | 100% | |

මෙම ආඥාලාභීන්ගෙන් 65% පමණ හෙරොයින්, නීතිවිරෝධි මත්පැන් හෝ ගංජා වලට ඇබ්බැහි වූවන් වේ.





ඉහත ප්‍රස්ථාරයට අනුව වැඩිම ආඥාලාභීන් ප්‍රමාණයක් විවාහකයන් වන අතර විවාහක ආඥාලාභීන් ප්‍රමාණය මුළු ආඥාලාභීන්ගෙන් 67% කි.


❖ මේ අනුව මෙම පුද්ගලයන් ප්‍රජා විශෝධනයට යොමු නොවී බන්ධනාගාරගත වූයේ නම් ඔවුන්ගෙන් යැපෙන්නන්ද සාමාජීය හා ආර්ථික වශයෙන් දැඩි පීඩනයට ලක්වේ. ආඥාලාභියාගේ කාලත්‍රයාද පවුලේ ආර්ථිකමය ගැටළු මගහරවා ගැනීම සඳහා අපරාධ ක්‍රියාවලට පෙළඹීමේ හැකියාව පවතින අතර ප්‍රජා විශෝධනයට යොමු වීම නිසා එම තත්වය මග හැරී ඇත.




ඉහත තොරතුරු අනුව බහුතරයක් ආඥාලාභීන් පිරිමි පුද්ගලයන් වන අතර ඉතාම අඩු සංඛ්‍යාවක් කාන්තාවන් වේ .ඒ අනුව පුරුෂයන් බහුතරයක් අපරාධ සම්බන්ධව අධිකරණයෙන් වරදකරුවන් වී ඇති බව පෙනේ.




ඉහත ප්‍රස්ථාරයට අනුව 2018 වසරේ බහුතර ආඥාලාභීන් ප්‍රමාණය අ.පො.ස.(සා.පෙළ) දක්වා පාසැල් අධ්‍යාපනය ලබා ඇත .එය 27% ක අගයක් ගනී .දෙවනුව .7-9 වසර දක්වා පාසැල් අධ්‍යාපනය ලැබූ අය වේ.එම අගය 23% කි. අ.පො.ස.(උ.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබූ අය හා පාසැල් නොගිය ප්‍රමාණය සමාන අගයන් ගනී. එම අගයන් 6% බැගිනි. ඉහත සංඛ්‍යා ලේඛන අනුව අ.පො.ස.(සා.පෙල) දක්වා අධ්‍යාපනය ලැබූ ප්‍රමාණය 88% ක් වේ. ඒ අනුව ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගෙන් බහුතරය අඩු අධ්‍යාපනයක් ලැබූ අය වේ. මින් පැහැදිලි වන්නේ අඩු අධ්‍යාපනයක් ලැබූ පිරිස අපරාධකාරී චර්යාවන්ට පෙළඹී ඇති බවයි.




2018 වර්ෂයේ සංඛ්‍යාලේඛන අනුව බහුතර අඥාලාභීන් ප්‍රමාණයක් කම්කරුවන් වන අතර දෙවනුව තාවකාලික රැකියාවල නිරත වන අය වේ. ස්ථිර රැකියාවක නියුතු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 11% කි. ඉහත දත්ත අනුව 58% ක ආඥාලාභීන් ප්‍රමාණයක් කම්කරුවන් වන අතර තාවකාලික රැකියාවල නියුතු අය හා රැකියා විරහිත ප්‍රමාණය පිළිවෙලින් 26% සහ 5% අගයන් ගනී. කෙසේ වෙතත් ස්ථිර රැකියාවැති ආඥාලාභීන්ට වඩා සෙසු ආඥාලාභීන් ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා අතර එය 89% වේ. මේ අනුව ආර්ථික තත්ත්වයෙන් පහළ පුද්ගලයන් වැරදි සඳහා පෙළඹීමේ ප්‍රවණතාවයක් පවතින බව පෙනී යයි.




ඉහත ප්‍රස්ථාරයට අනුව බොහෝ අඥාලාභීන් වයස් කාණ්ඩ 23-32 ට අයත් වේ .ඒ අනුව පැහැදිළි වන්නේ බොහෝ තරුණ පිරිස සම කණ්ඩායම් වල බලපෑම නිසා හෝ නිසි රැකියාවන් නොමැති වීම නිසාත් අපරාධ සඳහා පෙළඹෙන බවයි. තවදුරටත් වයස් කාණ්ඩ 18-22,23-32,33-37,38-42.සැලකිය යුතු මට්ටමින් අපරාධ කිරීම් සම්බන්ධව ඉහළ අගයක් ගන්නා අතර මෙම ආඥාලාභීගේ අපරාධකාරී හැසිරීම් සමාජයේ ආර්ථික ,සමාජීය හා අධ්‍යාත්මික වර්ධනය කෙරෙහි සැලකිය යුතු අන්දමින් බලපායි.

**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**


**(බස්නාහිර පළාත)**




2018 වසරේ සංඛ්‍යා ලේඛන අනුව ප්‍රජා පාදක විශෝධන ආඥා මෙන්ම හෙරොයින් සම්බන්ධ ආඥා බහුතරයක් ලැබී ඇත්තේ බස්නාහිර පළාතෙනි .එම ආඥා ප්‍රමාණය වසරින් වසර වර්ධනය වේ .

2017 වසරේ දී මෙන්ම 2018 වසරේදීද හෙරොයින් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත. 2018 වසරේ දී සූදුව සහ වෙනත් වැරදි සම්බන්ධ වැරදි සඳහා ලබා දී ඇති ආඥා ප්‍රමාණය වර්ධනය වී ඇත.වෙනත් වැරදි යටතේ බස්නාහිර පළාත තුළ බහුලව වාර්තාවී ඇත්තේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය,බීමත්ව රිය පැදවීම සහ මහා මාර්ගයේ කසළ දැමීමයි.


**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**
**(මධ්‍යම පළාත)**



2017-2018 වසර වල මධ්‍යම පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත. 2017 වසරට වඩා 2018 වසරේදී මධ්‍යම පළාත තුළ හෙරොයින් සම්බන්ධ ආඥා විශාල ප්‍රමාණයක් ද ලැබී ඇත .

**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**


**(ඌව පළාත)**




2017-2018 වසර වල ඌව පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත .ගංජා සඳහා සැලකිය යුතු මට්ටමින් 2017 වසරට වඩා 2018 වසරේදී අඩු ආඥා ප්‍රමාණයක් ලැබී ඇත


**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**

**(දකුණු පළාත)**



2018 වසර තුල දකුණු පළාතෙහි වෙනත් වැරදි සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත . තවදුරටත් 2017 වසරට සාපේක්ෂව 2018 වසර තුල නීති විරෝධී මත්පැන් සම්බන්ධව ලැබී ඇති ආඥා ප්‍රමාණයෙහි අඩුවීමක් දැකිය හැකි නමුත් වෙනත් වැරදි සඳහා ලබා දෙන ලද ආඥා ප්‍රමාණය 99.21% ක ප්‍රතිශතයකින් වැඩිවී ඇත.2018 වර්ශයේ තුළ වෙනත් වැරදි ලෙස වාර්තාවී ඇත්තේ බීමත්ව රිය පැදවීමයි.


**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව (සබරගමුව පළාත)**




2018 වසරේ දී සබරගමුව පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව ප්‍රමාණාත්මක වැඩිවීමකි. තවද හෙරොයින් සම්බන්ධ වැරදි සහ වෙනත් වැරදි වල වැඩි වීමක් දැකිය හැකිය .

**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**


**(නැගෙනහිර පළාත)**



2018 වර්ශයේ නැගෙනහිර පළාත තුළ මහජන පීඩා සම්බන්ධ වැරදි ඉහළ අගයක් ගන්නා නමුත් එය පසුගිය වසරට වඩා අඩු අගයකි. නීති විරෝධි පත්පැන් සම්බන්ධ වැරදි 2017 වසරට සාපේක්ෂව ඉහළ අගයක් ගනී .


**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**

**(වයඹ පළාත)**





වයඹ පළාත තුළ 2018 වර්ශයේ නීතිවිරෝධි මත්පැන් සම්බන්ධ වැරදි සඳහා ආඥා ලැබූවන්ගේ ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා නමුත් එය 2017 ට සාපේක්ෂකව 50% ක පමණ අඩුවීමකි. 2017-2018 වර්ෂ වලදී වයඹ පළාත තුළ මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් සඳහා වූ විශේෂ ව්‍යාපෘතිය මීට හේතු වී ඇති බව නිගමනය කළ හැකිය.

**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**
**(උතුරුමැද පළාත)**




මෙම පළාත තුළ 2018 වර්ශයේ නීතිවිරෝධි මත්පැන් සඳහා වැරදි ඉහළ අගයක් ගනී. එය පසුගිය වසරට සාපේක්ෂව අඩු අගයකි.ගංජා, මහජන පීඩා සම්බන්ධ වැරදි සඳහා නියෝග ලාභීන්ගේද අඩුවීමක් පෙන්නුම් කරයි.

**2017-2018 වර්ෂවල වරද අනුව ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව**
**(උතුරු පළාත)**




2018 වර්ශයේ මෙම පළාත තුළ වෙනත් කාණ්ඩයට අයත් වැරදි ඉහළ අගයක් ගන්නා බව ඉහත ප්‍රස්ථාරය අනුව පෙනී යයි.මෙහිදී වෙනත් වැරදි යටතේ බහුලව වාර්තාවී ඇත්තේ බීමත්ව රිය පැදවීම සහ නීති විරෝධී ලෙස ගස් කැපීමයි. මහජන පිඩා,නීති විරෝධී මත්පැන් සහ ගංජා සම්බන්ධ වැරදි සැලකිය යුතු මට්ටමින් ඉහළ අගයක් ගත්ත ද එය 2017 වසරට සාපේක්ෂව අඩු අගයකි.


## පවත්වන ලද විශෝධන වැඩසටහන් 2018.01.01 -2018.12.31



## 2.2 පවත්වන ලද විවිධ විශෝධන වැඩසටහන් - (2018-01-01 - 2018-12-31)

ප්‍රජා විශෝධන ආඥාලාභීන් වෙනුවෙන් උපදේශන හා මත්නිවාරණ, අධ්‍යාත්මික සංවර්ධන හා වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර ඔවුන් සම්බන්ධ කරගනිමින් වෛද්‍ය ප්‍රතිකාර වැඩසටහන් රැසක් සාර්ථකව දිවයින පුරා අධිකරණ මට්ටමින් ක්‍රියාත්මක කර ඇත.

**පවත්වන ලද විශෝධන වැඩසටහන්**




- 2018 වර්ෂයේදී විශෝධන වැඩසටහන් පැවැත්වීම සඳහා ආඥාලාභීන් හා සම්පත්දායකයින් සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් එක් වැඩසටහනක් සඳහා රු.10,000.00ක මුදලක් ලබා දෙන ලදි.ඒ අනුව 2018 වර්ෂයේ වැය කරන ලද මුදල් ප්‍රමාණය


  (2018.01.01සිට2018.12.31 දක්වා )

| වැඩසටහන් සංඛ්‍යාව | වියදම |
|---|---|
| 3228 | 978,371.00 |

## 2.2.1 උපදේශන හා මත් නිවාරණ වැඩසටහන්

ප්‍රාදේශීය කාර්යාල මගින් 2018.12.31 දක්වා මත්නිවාරණ හා උපදේශනාත්මක වැඩසටහන් සිදුකර ඇත. එය පළාත් අනුව පහත පරිදි දැක්විය හැකිය.

**උපදේශන හා මත් නිවාරණ වැඩසටහන්**




**උපදේශණ හා මත් නිවාරණ වැඩසටහන්**



පුද්ගල උපදේශන වැඩසටහන- නුගේගොඩ ප්‍රජා විශෝධන කාර්යාලය



කණ්ඩායම් උපදේශන වැඩසටහන කළුතර ප්‍රජා විශෝධන කාර්යාලය



මත් නිවාරණ වැඩසටහන -
ප්‍රජා විශෝධන කාර්යාලය
බණ්ඩාරවෙල




මත් නිවාරණ වැඩසටහන -
ප්‍රජා විශෝධන කාර්යාලය
මඩකලපුව

## 2.2.2 සංවර්ධන හා ශ්‍රමදාන වැඩසටහන්

ප්‍රාදේශීය කාර්යාල මගින් ප්‍රජා විශෝධන ආඥාලාභීන් යොදවා ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහන්, පාසල් ගොඩනැගිලි හා විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රමදාන වැඩසටහන් පවත්වා ඇත. පළාත් මට්ටමින් පහත පරිදි එය දැක්විය හැක.

**සංවර්ධන සහ ශ්‍රමදාන වැඩසටහන්**





ශ්‍රමදාන වැඩසටහන ගල්කිස්ස ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය




ශ්‍රමදාන වැඩසටහන කල්මුණේ ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය

### 2.2.3 ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන්

2018 වර්ෂය තුළ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව මඟින ආඥාලාභීන් සඳහා විවිධ ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන් සිදු කර ඇත.

**ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්**





ආගමික හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන -ප්‍රජා විශෝධන කාර්යාලය ඇඹිලිපිටිය



ආගමික හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන -ප්‍රජා විශෝධන කාර්යාලය කල්මුණේ



ආගමික හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන -ප්‍රජා විශෝධන කාර්යාලය කළුතර



ආගමික හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන -ප්‍රජා විශෝධන කාර්යාලය අරනායක

## 2.2.4. ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන්



ප්‍රජා විශෝධන කාර්යාලය - මොරවක



ප්‍රජා විශෝධන කාර්යාලය -හෝමාගම






ප්‍රජා විශෝධන කාර්යාලය -
මීනුවන්ගොඩ

ප්‍රජා විශෝධන කාර්යාලය -
මීනුවන්ගොඩ

ආඥා ලාභීන්ගේ අධ්‍යාපන මට්ටම,ආර්ථික මට්ටම හා හැකියාව අනුව ඔවුන් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කරනු ලබයි. 2018 වසරේදී එසේ යොමු කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව 2469 කි පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව 292කි. මේ සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය,විදාතා සම්පත් මධ්‍යස්ථාන,ජාතික ශිල්ප සභාව වැනි ආයතනවල සහයෝගය මෙම දෙපාර්තමේන්තුවට ලැබේ.

## ආඥාලාභීන් සඳහා විශෝධන වැඩසටහන් හා පුහුණු වැඩසටහන්





විශෝධන වැඩසටහන

සම්මන්තුරෙයි

මත් නිවාරණ හා දැනුවත් කිරීමේ වැඩසටහන - මඩකලපුව

## 2.3 මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය - වයඹ, දකුණ සහ සබරගමුව පළාත්

### 2.3.1. පසුබිම

වයඹ, දකුණ හා සබරගමුව පළාත්වල පසුගිය වසර 05 තුළ නීති විරෝධී මත්පැන් සඳහා පුද්ගලයන් 16,362 ක්,ගංජා සඳහා පුද්ගලයින් 1,615 ක් හා හෙරොයින් සඳහා පුද්ගලයින් 1,364ක් වෙත ප්‍රජා විශෝධන නියෝග ලබාදී ඇත. 2017 වසරේ මෙම පළාත් තුන තුළ ප්‍රජා විශෝධන නියෝග ලැබූ සමස්ථ ආඥාලාභීන් සංඛ්‍යාව 5250ක් වන අතර ඉන් 3271ක් (62.30%) නීතිවිරෝධී මත්පැන් හා මත් ද්‍රව්‍ය වැරදි සඳහා ආඥා ලැබූවන් වේ. ශ්‍රී ලංකාවේ පළාත් වශයෙන් ගත් කළ නීතිවිරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා වැඩි වරදකරුවන් ප්‍රමාණයකට ඉහත පළාත් තුන තුල ප්‍රජා පාදක විශෝධන නියෝග ලබා දී ඇත. එසේ හෙයින් යථෝක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පළාත් තුන තෝරාගන්නා ලදි.

මත් ද්‍රව්‍ය භාවිතා කරන වරදකරුවන් සඳහා විශෝධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේදී මත් නිවාරණ ප්‍රතිකාර සැලැස්මකින් පසුව එය ක්‍රියාත්මක කළ යුතු බව හඳුනාගෙන ඇති අතර මෙලෙස ප්‍රතිකාර සැලැස්මක් අවශ්‍ය වන්නේ දීර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම නිසා ඒ සඳහා ඇබ්බැහි වූ තැනැත්තන් ඉන් මුදවා ගැනීම මූලික කාරණයක් වන බැවින්ද, එසේ ප්‍රතිකාර සැලැස්මකින් තොරව එවැනි වරදකරුවන් විශෝධනය කිරීම නිරර්ථක ක්‍රියාවක් වන බැවින්ය. විශේෂයෙන්ම හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිතා කරන වරදකරුවන් විශෝධනය කිරීම සඳහා විශේෂ වූ වැඩපිළිවෙලක් අවශ්‍ය වන අතර ඒ සඳහා ප්‍රතිකාර සැලැස්මක් මෙන්ම උපදේශන ක්‍රියාවලියක්ද ක්‍රියාත්මක කල යුතු වේ .

## 2.3.2. වර්ෂ 2018 දී මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ලබා දී ඇති ප්‍රජා පාදක විශෝධන නියෝග පිළිබඳ තොරතුරු

| පළාත | වරද අනුව නියෝග ගණන | | | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ලැබුණු මුළු නියෝග | වසර තුළ ලැබුණු මුළු නියෝග | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ලැබුණු නියෝග ප්‍රතිශතය(%) |
|---|---|---|---|---|---|---|
| | හෙරොයින් | නීති විරෝධී මත්පැන් | ගංජා | | | |
| වයඹ | 62 | 546 | 35 | 643 | 890 | 72.24% |
| බස්නාහිර | 2508 | 1060 | 689 | 3089 | 5382 | 57.39% |
| උතුරු මැද | 04 | 136 | 16 | 156 | 214 | 72.89% |
| ඌව | 40 | 284 | 52 | 376 | 495 | 75.95% |
| සබරගමුව | 103 | 762 | 86 | 951 | 1191 | 79.84% |
| මධ්‍යම | 171 | 238 | 165 | 574 | 825 | 69.57% |
| දකුණ | 222 | 473 | 175 | 870 | 1972 | 44.11% |
| නැගෙනහිර | 05 | 132 | 71 | 208 | 496 | 41.93% |
| උතුර | 16 | 157 | 129 | 302 | 1318 | 22.91% |

## 2.3.3. ව්‍යාපෘතියේ අරමුණු

- ❖ වයඹ, දකුණ හා සබරගමුව පළාත් තුළ නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගෙන් 70%ක් ඉන් මුදවා ගැනීම
- ❖ ඉහත පළාත් තුළ නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගෙන් තෝරාගත් පවුල් 585 ක ආර්ථිකය ශක්තිමත් කිරීම
- ❖ මත්ද්‍රව්‍ය සඳහා වැය කරනු ලබන මුදල්, පවුලේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සඳහා යෙදවීම මඟින් ඔවුන් සාමාජීයීය වශයෙන් උසස් මට්ටමකට ගෙන ඒම
- ❖ මත්ද්‍රව්‍ය භාවිතයට ගැනීම හා භාවිතා කිරීමට වැය කරන කාලය වෙනත් කාර්යක් සඳහා යෙදවීම හරහා සමාජයේ අත්‍යාවශ්‍ය පුද්ගලයකු බවට පත් කිරීම (ආර්ථික කටයුතු /ආගමික කටයුතු/ පවුලේ සාමාජිකයන් සමඟ විනෝදවීම/ සමාජ සේවා කටයුතු යනාදිය සඳහා යොමු කිරීම)

- ❖ මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කර ගැනීම තුළින් සෞඛ්‍ය සම්පන්න පුද්ගලයින් ලෙසත්, පවුලේ සාමාජිකයන් අතර වගකීම් දරණ පුද්ගලයකු බවට පත් කිරීම හා පවුල තුළ පවතින බැඳීම වඩාත් තහවුරු කිරීම.

### 2.3.4. ව්‍යාපෘතියේ උපායමාර්ග

- ❖ යථෝක්ත පළාත් තුළ පිහිටි මහේස්ත්‍රාත් අධිකරණ 35ක ප්‍රජා විශෝධන නිලධාරීන් 37ක් සේවයේ යොදවා ඇති අතර ආඥාලාභීන්ගේ ප්‍රජා වැඩ අධීක්ෂණය හා කාර්යාල කටයුතු සඳහා සහය වීමට මෙම කාර්යාල සඳහා වැඩ පරීක්ෂකවරු 44 ක් අනුයුක්ත කර ඇත. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 117 ක් සඳහා සංවර්ධන නිලධාරීන් 117 ක් අනුයුක්ත කර ඇත. මෙම නිලධාරීන් සියලු දෙනාම විශෝධන ක්‍රියාවලියට දායක කරගත හැකි පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

- ❖ ආඥාලාභීන්ගෙන් වැඩි ප්‍රමාණයක් නීති විරෝධී මත්පැන් සම්බන්ධ වැරදි සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබා ඇති අතර ඔවුන්ගෙන් බොහොමයක් වයස අවුරුදු 18 - 40ත් අතර පුද්ගලයන් වේ .මෙවැනි වරදකරුවන් සාර්ථකව විශෝධනය කර නිසි වෘත්තීය මාර්ගෝපදේශන හා කළමනාකරණ හැකියාව වර්ධනය කිරීම ප්‍රජා විශෝධන නිලධාරී සහ සංවර්ධන නිලධාරී විසින් සිදුකරන ලද අතර එමගින් ඔවුන්ගේ ජීවිත වඩා යහපත් කරගැනීමට අවස්ථාව සලසා දී ඇත. මෙම ආඥාලාභීන්ගෙන් පිරිසක් දෛනික හෝ තාවකාලික රැකියාවන්හි නිරත වන අතර තවත් පිරිසක් රැකියාවක් නොමැති පුද්ගලයන් වන බැවින් ඔවුන් ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි .මෙම ආඥාලාභීන්ගේ අධ්‍යාපන තත්වය ඉතා අවම මට්ටමක පැවතීමත් විධිමත් රැකියාවක් සඳහා යොමු නොවීමත් යන කරුණු තාවකාලිකව මුදල් ඉපයිය හැකි රැකියාවන්හි නිරත වීමටත්, මත්ද්‍රව්‍ය භාවිතය හා ඒ ආශ්‍රිත වැරදි සිදු කිරීමටත් බලපා ඇත.

## 2.3.5. ව්‍යාපෘතියේ ප්‍රතිඵල

2018 වර්ෂයේදී වයඹ, සබරගමුව හා දකුණු පළාත්වල මහේස්ත්‍රාත් අධිකරණ මඟින් පුද්ගලයින් 4,053ක් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබාදී ඇත. මෙම පුද්ගලයින් අතරින් මත්ද්‍රව්‍ය සමබන්ධව වැරැදි සඳහා පුද්ගලයින් 3,140ක් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබාදී ඇති අතර සෘජුවම මත් ද්‍රව්‍ය (ගංජා, හෙරොයින් හා නීති විරෝධී මත්පැන්) සම්බන්ධ වැරැදිකරුවන් සංඛ්‍යාව 2386 කි.

මෙම ව්‍යාපෘතිය යටතේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරැදිකරුවන්, විශේෂ මත් නිවාරණ උපදේශන ක්‍රියාවලියෙන් පසුව මත් ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබන අතර එහිදී වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි නේවාසික හෝ සායනික ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබයි. ප්‍රතිකාර ලබාදෙන අතරතුර, ප්‍රතිකාර මඟින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්ව නිවෙසට පැමිණෙන පුද්ගලයින් පවුල තුළ පිළිගැනීම හා පවුල් සංවර්ධනය සඳහා පවුලේ සෙසු සාමාජිකයින්ගේ සහයෝගය ලබාගත යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම හා සූදානම් කිරීම සිදු කරනු ලබයි. ප්‍රතිකාරවලින් පසුව ස්ථිර ආදායමක් ලබා ගත හැකි රැකියාවකට යොමු කිරීම හෝ රැකියාවක් කිරීමට අවශ්‍ය නිපුණතාවය ලබා ගැනීම සඳහා මෙම පුද්ගලයින් යොමු කරනු ලබයි. එමෙන්ම ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා හැකියාව හා කැමැත්ත තිබෙන පුද්ගලයින් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා යොමු කරනු ලබයි. ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ආරම්භක ප්‍රාග්ධනය සලසාගත නොහැකි ආඥාලාභීන් සඳහා මෙම ව්‍යාපෘතිය රු.50,000.00 ක උපරිමයකට යටත්ව මූල්‍ය ආධාරයක්ද ලබාදීමට කටයුතු කර ඇත.



ආඥාලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - ආරච්චිකට්ටුව



ආඥාලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - වැලිගම



ආඥාලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - මාතර



ආඥාලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - අඟුනකොළපැලැස්ස

### 2.3.6. ව්‍යාපෘතියේ ප්‍රගතිය

| ප්‍රගතිය | වයඹ | සබරගමුව | දකුණ |
|---|---|---|---|
| ආඥාලාභීන් මතින් මුදවා ගැනීමේ ප්‍රගතිය (මතින් මුදවා ගන්නා ලද සංඛ්‍යාව ÷ ප්‍රතිකාර සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව × 100) | 68.13% | 88.53% | 94.90% |
| ලබාගත් ආඥාලාභීන් සංඛ්‍යාව (මත්ද්‍රව්‍ය සම්බන්ධ) | 877 | 1089 | 1174 |
| ප්‍රතිකාර සම්පූර්ණ කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව | 475 | 349 | 255 |
| මතින් මුදවා ගන්නා ලද සංඛ්‍යාව(සෙසු | 325 | 309 | 242 |
| රැකියා / ස්වයං රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව | 156 | 33 | 80 |
| තවදුරටත් විශෝධන ක්‍රියාවලියේ සිටින සංඛ්‍යාව | 150 | 40 | 13 |

### 2.3.7. ව්‍යාපෘතිය සඳහා දරණ ලද වියදම

| **වියදම් දරණ ලද කාර්යය** | **වයඹ** | **සබරගමුව** | **දකුණ** |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ රාජකාරි කටයුතු කරනු ලබන නිලධාරීන් පුහුණු කිරීම(ප්‍රජා විශෝධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා වැඩ පරීක්ෂකවරුන්) | 89,277.00 | 571,011.00 | 1,038,853.00 |
| ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ලබාදී ඇති මුදල රු. | රු.2,054,060.00 | 476,000.00 | 1,475,250.00 |
| ආඥාලාභීන් සඳහා වැඩසටහන් පැවැත්වීම | 8,310.00 | 1860.00 | - |
| ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු සඳහා | 72,732.00 | 47,550.00 | 121,090.00 |

❖ මීට අමතරව පවුල් සංවර්ධන වැඩසටහන් යටතේ ස්වයං රැකියා ආධාර (ව්‍යාපෘති ක්‍රියාත්මක නොවන පලාත් වල ) රු.25000/=ක උපරිමයකට යටත්ව ආඥාලාභීන් 77 දෙනෙකු සඳහා රු.1,815,735.00 ප්‍රමාණයක් ලබා දෙන ලදි.

| පවුල් සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | වියදම |
|---|---|
| 79 | 1,850,735.00 |

# 3 ධාරිතා සංවර්ධනය

## 3.1 නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු කිරීමේ වැඩසටහන්

**(2018-01-01 -2018-12-31)**

දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම එක් ප්‍රධාන පියවරයක් ලෙස හඳුනා ගන්න ලදි. එසේ හඳුනා ගත් පුහුණු අවශ්‍යතා පදනම් කර ගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ප්‍රජා විශෝධන නිළධාරීන්, වැඩ පරීක්ෂක වරුන් හා සංවර්ධන නිලධාරීන් සඳහා පහත පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර මීට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ඇතුළු අධ්‍යයන ආයතන වෙත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කරන ලදි.

## 3.2 2018 වසරේදී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් සඳහා මුදල් ගෙවීම් කර ඇති ආකාරය

| | නිලධාරින් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ස.කො (පාලන) | ගණකාධිකාරි | ජ්‍යෙ.ප්‍ර.වි.නි. (පළාත්) | ප්‍ර.වි.නි | සංවර්ධන නිලධාරි | තොරතුරු තාක්ෂණ | ර.ක.ස | ධා.ස |
| වැඩසටහන් සංඛ්‍යාව | 2 | 2 | 3 | 1 | 2 | 2 | 6 | 1 |
| වියදම් වූ මුදල රු. | රු.420,620.00 රු. 1294.97 | රු.107,000.00 | 106000 රු.2400 | රු.250000.00 | රු.73000.00 | රු.46500.00 | රු.488,980.00 | රු.50000.00 |

## 4. ඉදිරි සැලසුම්

01. මතට ඇබ්බැහි වූ සුළු වැරකරුවන් වරදින් මිදුණු යහපත් පුද්ගලයින් බවට පත් කිරීම හා ඔවුන්ගේ පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ක්‍රමවේදයක් සකස් කිරීම(මත්පැන් හා මත්ද්‍රව්‍ය පිළිබඳ විශේෂ ව්‍යාපෘතිය බස්නාහිර හා නැගෙනහිර පළාත් තුළ ව්‍යාප්ත කිරීමට නියමිතය.)

02. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම තුලින් ප්‍රජා පාදක විශෝධන ආඥා සංඛ්‍යාව ඉහල නැංවීම (රක්ෂිත බන්ධනාරයේ සිටින රැඳවියන් වරදකරුවන් වන්නේ නම් ප්‍රජා පාදක විශෝධන ආඥා ඉල්ලා සිටීමට දැනුවත් කිරීම ඇතුලත්ව) හා බන්ධනාගාර ගත වන සුළු වැරදිකරුවන් ප්‍රමාණය අවම කිරීම .

03. ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා විශෝධනය සම්බන්ධ පශ්චාත් උපාධි පාඨමාලාවක් හඳුන්වාදීම.

04. සංවර්ධන නිලධාරීන් හරහා ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ පසු විපරම් ක්‍රියාවලිය විධිමත් කිරීම

05. නිලධාරින්ගේ ප්‍රගතිය ඇගයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.

06. ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා තොරතුරු කළමණාකරණ පද්ධතියක් සැකසීම

## 05 . මූල්‍ය කාර්ය සාධනය

### ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් - 2018

| ව්‍යාපෘති අංකය/නම,පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | මු.රෙ.66 සහ මු.රෙ.69 අනුව මාරු කිරීම | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුද්ගල පඩිනඩි | 236,400,000 | - | -918,000 | 235,482,000 | 230,747,981 | 4,734,019 |
| අනෙකුත් වියදම් | 40,558,000 | - | -4,543,000 | 36,015,000 | 33,742,322 | 2,272,678 |
| මුළු එකතුව | 276,958,000 | - | -5,461,000 | 271,497,000 | 264,490,303 | 7,006,697 |

## මූලධන වියදම

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ.69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2001 | | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 600,000 | | | 600,000 | 360,446 | 239,554 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 200,000 | | | 200,000 | 160,290 | 39,710 |
| 2003 | | 11 | වාහන | 200,000 | | | 200,000 | 44,280 | 155,720 |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 4,000,000 | | 1,440,000 | 5,440,000 | 3,878,112 | 1,561,888 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | | 195,000 | 1,195,000 | 1,176,550 | 18,450 |
| 2401 | | 11 | හැකියා වර්ධනය හා ආයතනික සංවර්ධනය | 4,000,000 | | | 4,000,000 | 2,355,349 | 1,664,651 |
| 2509 | | 11 | වෙනත් | 5,000,000 | | 3,826,000 | 8,826,000 | 8,819,318 | 6,681 |
| | | | | | | | | | |
| | | | එකතුව | **1,5,000,000** | | **5,461,000** | **20,461000** | **16,774,345** | **3,686,655** |